කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

# ශ්‍රී ලංකාව සඳහා සාමාන්‍යය කාලගුණ අනාවැකිය
# GENERAL WEATHER FORECAST FOR SRI LANKA

ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදි
Issued by Forecasting Division, National Meteorological Centre

**2022 සැප්තැම්බර් මස 03 දින සඳහා කාලගුණ අනාවැකිය**
**2022 සැප්තැම්බර් මස 03 දින උදෑසන 05.30 ට නිකුත් කරන ලදි.**

අද (03) සවස් කාලයේ සිට ඉදිරි දින කිහිපයේ, දිවයිනේ නිරිත දිග කොටසේ (බස්නාහිර සහ සබරගමුව පළාත් සහ මහනුවර, නුවරඑළිය, ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කවල) වැසි තත්ත්වයේ තරමක වැඩිවීමක් බලාපොරොත්තුවේ.

බස්නාහිර, සබරගමුව සහ වයඹ පළාත්වලත් මහනුවර, නුවරඑළිය, ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කවලත් විටින් විට වැසි ඇතිවේ. සබරගමුව පළාතේ සහ මහනුවර, නුවරඑළිය සහ කළුතර දිස්ත්‍රික්කවල ඇතැම් ස්ථානවලට මි.මී. 50 ට වැඩි තරමක තද වැසි ද ඇතිවිය හැක.

යාපනය දිස්ත්‍රික්කයේ වැසි වාර කිහිපයක් ඇතිවේ.

ඌව පළාතේත් මඩකළපුව සහ අම්පාර දිස්ත්‍රික්කවලත් සවස් කාලයේදී හෝ රාත්‍රී කාලයේදී ස්ථාන ස්වල්පයක වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ.

මධ්‍යම කඳුකරයේ බටහිර බෑවුම් ප්‍රදේශවල විටින් විට හමන **පැ.කි.මී. 50** ක පමණ තද සුළං ඇතිවිය හැක.

**ගිගුරුම් සහිත වැසි සමග ඇතිවිය හැකි තාවකාලික තද සුළං වලින් සහ අකුණු මඟින් සිදු වන අනතුරු අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ජනතාවගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.**

**දෘශ්‍ය ලෙස සූර්යයා දකුණට ගමන් කිරීමේදී, අගෝස්තු මස 28 වන දින සිට සැප්තැම්බර් 07 දක්වා ශ්‍රී ලංකාව ආසන්න අක්ෂාංශ වලට සෘජුවම ඉහලින් පවතී. අද (03) දින දහවල් 12:10 ට කාක්කපල්ලිය (පුත්තලම දිස්ත්‍රික්කය), හබරවැව (කුරුණෑගල දිස්ත්‍රික්කය), කිරිමැටියාව (මාතලේ දිස්ත්‍රික්කය), හබරාව (බදුල්ල දිස්ත්‍රික්කය), දිවුලාන (මඩකලපුව දිස්ත්‍රික්කය) යන ප්‍රදේශවලට හිරු මුදුන්ව පවතී.**

Rainfall amount (mm): Light: 00-12.5, Light to moderate: 12.5-25, moderate: 25-50, Fairly Heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.5, සිහින් හෝ මද වැසි: 12.5-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology
TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

**WEATHER FORECAST FOR 03 SEPTEMBER 2022**
**Issued at 05.30 a.m. on 03 September 2022**

**Showery condition is expected to enhance some extent in the south-western part (Western and Sabaragamuwa provinces and in Kandy, Nuwara-Eliya, Galle and Matara districts) of the island from today (03) afternoon for next few days.**

Showers will occur at times in the Western, Sabaragamuwa and North-Western provinces and in Kandy, Nuwara-Eliya, Galle and Matara districts. Fairly heavy rainfalls above 50mm may occur at some places in Sabaragamuwa province and in Kandy, Nuwara-Eliya and Kaluthara districts.

Several spells of showers will occur in Jaffna district.

Showers or thundershowers will occur at a few places in Uva province and in Batticaloa and Ampara districts during the evening or night.

Strong winds about **50 kmph** can be expected at times over the western slopes of the Central hills.

**General public is kindly requested to take adequate precautions to minimize damages caused by temporary localized strong winds and lightning during thundershowers.**

**On the apparent southward relative motion of the sun, it is going to be directly over the latitudes of Sri Lanka during 28th of August to 07th of September in this year. The nearest towns of Sri Lanka over which the sun is overhead today (03) are Kakkapalliya (Puttalam District), Habarewewa (Kurunegala District), Kirimetiyawa (Matale District), Habarawa (Badulla District) and Divulana (Batticaloa District) about 12.10 noon.**

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

## දිවයින වටා මුහුදේ කාලගුණය සහ ස්වභාවය
## WEATHER AND STATE OF SEA AROUND THE ISLAND

ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදි
Issued by Forecasting Division, National Meteorological Centre

### ඉදිරි පැය 24 ට දිවයින වටා වන මුහුදු ප්‍රදේශ සඳහා කාලගුණ අනාවැකිය
### 2022 සැප්තැම්බර් මස 03 දින උදෑසන 05.30 ට නිකුත් කරන ලදි.

| |
|---|
| **වැසි තත්ත්වය:** |
| දිවයින වටා වන මුහුදු ප්‍රදේශවල තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ. |
| **සුළඟ:** |
| දිවයින වටා වන මුහුදු ප්‍රදේශවල සුළං නිරිත දෙසින් හමා එයි. සුළගේ වේගය **පැ.කි.මී. (30-40)** පමණ වේ. කන්කසන්තුරය සිට මන්නාරම හරහා පුත්තලම දක්වා සහ ගාල්ල සිට මාතර සහ හම්බන්තොට හරහා පොතුවිල් දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල සුළගේ වේගය විටින් විට **පැ.කි.මී. (45-50)** දක්වා වැඩි විය හැක. |
| **මුහුදේ ස්වභාවය:** |
| කන්කසන්තුරය සිට මන්නාරම හරහා පුත්තලම දක්වා සහ ගාල්ල සිට මාතර සහ හම්බන්තොට හරහා පොතුවිල් දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශ විටින් විට රළු වේ. පුත්තලම සිට කොළඹ හරහා ගාල්ල දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශ විටින් විට තරමක් රළු වේ. දිවයින වටා වන සෙසු මුහුදු ප්‍රදේශ මද වශයෙන් රළු විය හැක. |

### WEATHER FORECAST FOR SEA AREAS AROUND THE ISLAND DURING NEXT 24 HOURS
### Issued at 05.30 a.m. on 03 September 2022

| |
|---|
| **Condition of Rain:** |
| Showers or thundershowers will occur at several places in the sea areas around the Island. |
| **Winds:** |
| Winds will be south-westerly and wind speed will be **(30-40) kmph**. Wind speed may increase up to **(45-50) kmph** at times in the sea areas off the coast extending from Kankasanturai to Puttalam via Mannar and Galle to Pottuvil via Hambanthota. |
| **State of Sea:** |
| The sea areas off the coast extending from Kankasanturai to Puttalam via Mannar and Galle to Pottuvil via Hambanthota will be rough at times and sea areas off the coast extending from Puttalam to Galle via Colombo will be fairly rough at times. The other sea areas around the island may be moderate. |

Rainfall amount (mm): Light: 00-12.5, Light to moderate: 12.5-25, moderate: 25-50, Fairly Heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.5, සිහින් හෝ මද වැසි: 12.5-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි